   (iii) මනා රාජ්‍ය පාලනයක් පවත්වා ගැනීමට බුදුසමය සපයන උපදෙස් විස්තර කරන්න. (ලකුණු 07 යි)

8. (i) 'එකෙන හොගෙ හුඤ්ජෙය්‍ය' යන ගාථාව සම්පූර්ණ කරන්න. (ලකුණු 04 යි)
   (ii) බුදුරදුන්ගේ ආර්ථික උපදෙස් විමසූ දීඝජානු කෝලිය පුත්‍රයාට දෙසන ලද සූත්‍ර දේශනාව කවරේදැයි සඳහන් කර එහි ඇතුළත් මූලික කරුණු නම් කරන්න. (ලකුණු 07 යි)
   (iii) 'ශ්‍රම අභිමානය රැකගනිමින් වැඩ කිරීමට උපදෙස් දෙන බුදු දහම දැහැමි ආර්ථික ප්‍රතිපත්ති සමුදායක් ඉදිරිපත් කරයි.' යන ප්‍රකාශය තහවුරු කරන්න. (ලකුණු 07 යි)

9. (i) ආර්ථික දියුණුවට උපකාර වන සම්ප්‍රදාය **හතර** නම් කරන්න. (ලකුණු 04 යි)
   (ii) ආරක්ඛ සම්පදාව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 07 යි)
   (iii) දැහැමි තුලනාත්මක තෘප්තිමත් ආර්ථිකයක් පවත්වා ගැනීමට බුදුසමය දෙන උපදෙස් විස්තර කරන්න. (ලකුණු 07 යි)

* * *

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

2556 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2011 (2012)

(05) බෞද්ධ සමාජ දර්ශනය

සවිස්තර ලකුණු දීමේ පටිපාටිය

1 ප්‍රශ්නය -	(i) සිට (iv) තෙක් කොටස්වලට ලකුණු 03 බැගින් 3 x4ලකුණු	12	12
	(v) කොටසට ලකුණු	04	04
	(vi) කොටසට ලකුණු	03	03
	(vii) කොටසට ලකුණු	02	02
	(viii) කොටසට ලකුණු	03	03
	(ix) සිට (x) තෙක් කොටස්වලට ලකුණු 02 බැගින් 2 x2 ලකුණු	04	04
2 ප්‍රශ්නයේ සිට 9 වැනි ප්‍රශ්නය තෙක් ප්‍රශ්න හතරකට			
	ලකුණු 18 බැගින් 18X4 ලකුණු	72	72
	මුළු ලකුණු		100

ආදර්ශ පිළිතුරු

1 කොටස

1. ප්‍රශ්නය

(i) අ) දිවිපැවැත්මට උපකාර වන ප්‍රධාන කරුණු හතරක් බුදු දහමෙහි 'සිවුපසය' නමින් හැඳින්වේ. එම 'සිවුපසය' නම්කරන්න.

පිළිතුර

චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලානප්පච්චය

උපදෙස්

ඉහත පිළිතුර හෝ ඇඳුම්, ආහාර, නිවාස, බෙහෙත් යන අදහස ප්‍රකට වන පිළිතුරක් හෝ සපයා තිබේ නම් එක (1) ලකුණක් ප්‍රදානය කරන්න.

(ආ) සිවුපස පරිභෝජනය දාර්ශනික විමර්ශනයකින් යුක්ත ව සිදුකිරීම සඳහා ප්‍රත්‍යවේක්ෂණ ක්‍රියාවලියක් බුදු දහම හඳුන්වා දෙයි. එම ප්‍රත්‍යවේක්ෂණ ක්‍රියාවලියෙහි ආහාර ගැනීමේ දී විමසිලිමත් වියයුතු කරුණුවලින් දෙකක් නම්කරන්න. (ලකුණු 03යි.)

පිළිතුර

පටිසංඛාය යොනිසෝ පිණ්ඩපාතං පටිසේවාමි නේව දවාය, න මදාය, න මණ්ඩනාය, න විභූසනාය, යාවදේව ඉමස්ස කායස්ස ඨිතියා, යාපනාය, විහිංසූපරතියා,බ්‍රහ්මචරියානුග්ගහාය, ඉති පුරාණං ච වෙදනං පටිහංඛාමි, නවං ච වේදනං න උප්පාදෙස්සාමි, යාත්‍රා ච මේ භවිස්සති, අනවජ්ජතා ච, ඵාසුවිහාරෝ ච ඉති යන පාඨයේ එන කරුණු දෙකක් පාලියෙන් ම හෝ සිංහලෙන් හෝ දක්වා තිබිය යුතුය.

උපදෙස්

පාලියෙන් හෝ සිංහලෙන් එක් කරුණක් දක්වා තිබේ නම් ලකුණු 01ක් ද කරුණු

Past Papers Wiki

දෙකක් දක්වා තිබේ නම් ලකුණු දෙදෙකක් ද ප්‍රදානය කරන්න.

නිවැරදි පිළිතුරට (අ) කොටසට ලකුණු 01ක් ද (ආ) කොටසට ලකුණු 02ක් ද වශයෙන් ප්‍රදානය කළ හැකි මුළු ලකුණු ගණන 03කි.

(ii) (අ) බෞද්ධ සමාජ දර්ශනයෙහි අන්තර්ගත විෂය කරුණුවලින් මූලික කරුණු දෙකක් නම් කරන්න.

පිළිතුර

(i) *සමාජය සකස් වී විකසිත වී වර්තමානයේ පවත්නා ආර්ථික දේශපාලන ස්වරූපයට පත්වූයේ කෙසේ ද,*

(ii) *එම පරිණාමය තුළ ක්‍රියාත්මක වුණු ප්‍රධාන බලවේග කවරේ ද,*

(iii) *වර්තමාන සමාජ දේශපාලන ආර්ථික අර්බුද විසඳා ගන්නේ කෙසේ ද,*

(iv) *යහපත හා අයහපත යුක්තිය හා අයුක්තිය නිර්වචනය කරන්නේ කෙසේ ද,*

(v) *සමාජ සංස්ථා, සංවිධාන හා සම්බන්ධතා ධර්මානුකූල කර ගන්නේ කවර අයුරින් ද යන විෂය කරුණුවලින් දෙකක් පිළිතුර ලෙස දැක්විය යුතුය.*

උපදෙස්

පිළිතුරට අදාළ කරුණු එකක් දක්වා තිබේ නම් ලකුණු (1) එකක් ද තිබේ නම් ලකුණු දෙකක් දක්වා තිබේ නම් ලකුණු 02ක් ද ප්‍රදානය කරන්න.

(ආ) සමාජ විද්‍යාව හා සමාජ දර්ශනය අතර තිබෙන මූලික වෙනස නම් කරන්න. (ලකුණු 03යි)

පිළිතුර

(i) *සමාජ විද්‍යාව ආර්ධර්ම විරහිතයි. සමාජ දර්ශනය ආර්ධර්ම හඳුන්වා දෙයි.*

(ii) *සමාජ විද්‍යාව සදුපදේශදානයෙන් තොරයි සමාජදර්ශනය සදුපදේශදානයෙන් යුක්තයි.*

(iii) *මනුෂ්‍ය ශිෂ්ටාචාරයේ දියුණුවට සමාජ විද්‍යාව මාර්ගෝපදේශ නො සපයයි. සමාජ දර්ශනය මානව ශිෂ්ටාචාරයේ දියුණුවට මාර්ගෝපදේශ සපයයි.*

(iv) *සමාජ විද්‍යාව ඥානය ඥානය සඳහාම යැයි පවසයි. සමාජ දර්ශනය ඥානය මිනිසාගේ ප්‍රගතිය සඳහා යයි පවසයි.*

උපදෙස්

ඉහත පිළිතුරට අදාළ කරුණුවලින් එක් කරුණක් දක්වා තිබේ නම් ලකුණු 01ක් ප්‍රදානය කරන්න.

නිවැරදි පිළිතුරට (අ) කොටසට ලකුණු 02ක් ද (ආ) කොටසට ලකුණු 01ක් ද වශයෙන් ප්‍රදානය කළ හැකි මුළු ලකුණු ගණන 03කි.

(iii) (අ) සමාජයක යුතුකම් හා අයිතිවාසිකම් ඉටුවීමට තම පුද්ගලයා තම භූමිකා නිසි පරිදි ඉටු කළ යුතුයැයි සඳහන් කරන ප්‍රකට සූත්‍ර දේශනාව නම් කරන්න.

පිළිතුර

සිගාලෝවාද සූත්‍රය.

PAST PAPERS WIKI

උපදෙස්

ඉහත පිළිතුර දක්වා තිබේ නම් ලකුණු 01ක් ප්‍රදානය කරන්න.

(ආ) 'මවුපියන් විසින් පුදුසු කල දායාද දවරා දීම හා යෝග්‍ය වයසේ ආවාහ විවාහ කර දීම සිදු කළ විට ඒ යුතුකම් වෙනුවෙන් දරුවන් විසින් ඉටු කළ යුතු යැයි මාපියන් සලකන යුතුකම් දෙකකි.' ඒ දෙක නම් කරන්න. (ලකුණු 03යි)

පිළිතුර

පරම්පරාව රැකගනියි.

උරුම වූ දේපළ රැකගනියි.

උපදෙස්

ඉහත සඳහන් කරුණු දෙක දක්වා තිබේ නම් ලකුණු 02ක් ද එකක් දක්වා තිබේ නම් ලකුණු 01ක් ද ප්‍රදානය කරන්න.

නිවැරදි පිළිතුරට (අ) කොටසට ලකුණු 01ක් ද (ආ) කොටසට ලකුණු 02ක් ද වශයෙන් ප්‍රදානය කළ හැකි මුළු ලකුණු ගණන 03කි.

(iv) (අ) 'බ්‍රහ්ම' චෙතස් මාපියන් වෙතත් ඇතැයි සැලකෙන ගුණාංග හතරකි. ඉන් දෙකක් නම්කරන්න.

පිළිතුර

මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා.

උපදෙස්

එක් ගුණාංගයක් දැක්වීමට එක් ලකුණ බැගින් ගුණාංග දෙක නම්කිරීමට ලකුණු 02ක් ප්‍රදානය කරන්න.

(ආ) හොඳ ආශ්‍රය සැපතටත් නරක ආශ්‍රය විපතටත් හේතුවන බැවින් මහා මංගල සූත්‍රයේ ආශ්‍රය නොකළ යුත්තෝ හා ආශ්‍රය කළ යුත්තෝ දැක්වෙති. එකී ආශ්‍රය කළ යුත්තන් නම්කරන්න. (ලකුණු 03යි)

පිළිතුර

ආශ්‍රය කළ යුත්තෝ පණ්ඩිතයෝය.

උපදෙස්

ඉහත දක්වුණු පිළිතුර දක්වා තිබේ නම් ලකුණු 01ක් ද ප්‍රදානය කරන්න.

නිවැරදි පිළිතුරට (අ) කොටසට ලකුණු 02ක් ද (ආ) කොටසට ලකුණු 01ක් ද වශයෙන් ප්‍රදානය කළ හැකි මුළු ලකුණු ගණන 03කි.

(v) (අ) වෘත්තීය අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සේවයා විසින් සේවකයාට කරන නමස්කාරයකැයි සිගාලෝවාද සූත්‍රයේ දැක්වේ. එසේ සේවයා විසින් ලබාදිය යුතු වෘත්තිය අයිතිවාසිකම් දෙකක් නම්කරන්න.

පිළිතුර

(i) *හැකියාවට අනුව සේවා නියම කිරීම*

(ii) *ආහාරපාන හා වැටුප් ලබා දීම*

(iii) *රෝගී වූ විට උවටැන් කිරීම*

(iv) *විශේෂ රැකවරණ දෙ බෙදාදීම*

(v) *වරින් වර සුදුසු කාලයට නිවාඩු දීම*

උපදෙස්

ඉහත දැක්වුණු පිළිතුරුවලින් එකක් දක්වා තිබේ නම් ලකුණු 01ක් ද දෙකක් දක්වා තිබේ නම් ලකුණු 02ක් ද ප්‍රදානය කරන්න.

(ආ) එම සූත්‍රයේ සේවකයාගේ යුතුකම් පහක් ද දැක්වේ. ඉන් දෙකක් නම් කරන්න. (ලකුණු 04යි)

පිළිතුර

(i) *ස්වාමියාට පෙර අවදි වෙයි* (ii) *ස්වාමියාට පසුව නින්දට යයි*

(iii) *දුන් දේ පමණක් ගනියි* (iv) *සේවය උසස් අන්දමින් ඉටු කරයි*

(v) *කීර්තිනිරාවය පතුරුවයි*

උපදෙස්

කරුණු එකක් නම්කිරීමට එක් ලකුණ බැගින් කරුණු දෙකක් නම්කිරීමට ලකුණු 02ක් ප්‍රදානය කරන්න.

නිවැරදි පිළිතුරට (අ) කොටසට ලකුණු 02ක් ද (ආ) කොටසට ලකුණු 02ක් ද වශයෙන් ප්‍රදානය කළ හැකි මුළු ලකුණු ගණන 04කි.

(vi) (අ) 'මහාසම්මතයෙන් රජෙකු පත් කරගැනුණේ මනුගෙන් සේවා කීපයක් ලබා ගැනීමට බව අග්ගඤ්ඤ සූත්‍රයේ දැක්වේ. ඒ සේවාවන්ගෙන් එකක් නම්කරන්න.

පිළිතුර

(i) *හෙළාදැකිය යුත්තන් හෙළාදැකීම* (ii) *ගැරහිය යුත්තන් ගැරහීම*

(iii) *පිටුවහල් කළ යුත්තන් පිටුවහල් කිරීම*

උපදෙස්

ඉහත කරුණුවලින් එක් කරුණක් දක්වා තිබේ නම් ලකුණු එකක් ප්‍රදානය කරන්න.

(ආ) ඒ සේවාවන් වෙනුමෙන් රජුට කළ දීමනාව කුමක් ද? (ලකුණු 03යි)

පිළිතුර

නම හැල් අස්මැන්නෙන් කොටසක් දීම

උපදෙස්

ඉහත පිළිතු දක්වා තිබේ නම් ලකුණු 02ක් ප්‍රදානය කරන්න.

නිවැරදි පිළිතුරට (අ) කොටසට ලකුණු 01ක් ද (ආ) කොටසට ලකුණු 02ක් ද වශයෙන් ප්‍රදානය කළ හැකි මුළු ලකුණු ගණන 03කි.

(vii) (අ) බුදු දහමෙහි ත්‍යාමධර්ම පසක් දැක්වේ. ඉන් මනෝවිද්‍යාත්මක නියාමය ලෙස සැලකෙන්නේ කුමන ත්‍යාමධර්මය ද?

පිළිතුර

චින්ත නියාමය

උපදෙස්

ඉහත පිළිතුර දක්වා තිබේ නම් ලකුණු 01ක් ප්‍රදානය කරන්න.

(ආ) ඒ අතරෙහි සදාචාර හේතු-ඵල සන්තතියක් සේ සැලකෙන්නේ කුමන. නියාමධර්මය ද? (ලකුණු 02යි)

පිළිතුර

කම්ම න්‍යාමය

උපදෙස්

ඉහත පිළිතුර දක්වා තිබේ නම් ලකුණු 01ක් ප්‍රදානය කරන්න.

නිවැරදි පිළිතුරට (අ) කොටසට ලකුණු 01ක් ද (ආ) කොටසට ලකුණු 01ක් ද වශයෙන් ප්‍රදානය කළ හැකි මුළු ලකුණු ගණන 02කි.

(viii) (අ) මෙත් වැඩිය යුතු ජීව-යුගල රැසක් කරණිය මෙත්ත සූත්‍රයේ දැක්වේ.ඉන් යුගල දෙකක් නම් කරන්න.

පිළිතුර

උපන් - නූපන් (භූත - සම්භවේසී), වංවල - ස්ථාවර (තස -ථාවර), දිග - මහත (දීඝ - මහන්ත) මඩ්‍යම - කෙටි (මජ්ඣිම -ඛුද්ද), කුඩා - මහත් (අණුක - ථූල), පෙනෙන - නොපෙනෙන (දිට්ඨ-අද්දිට්ඨ), දුර - ළඟ (දූරේ වසන්තා - අවිදූරේ වසන්තා).

උපදෙස්

ඉහත දැක්වූ යුගල දෙකක් සිංහලෙන් හෝ පාලියෙන් නිවැරදි කර තිබේ නම් ලකුණු 02ක් ප්‍රදානය කරන්න.

(ආ) එම සූත්‍රයේ උඩ යට සරස යන දිසාවල සතුරු බවක් නැතිව සිටිය යුතු බව සඳහන් වේ. එම සූත්‍රපාඨය ලියන්න. (ලකුණු 03යි)

පිළිතුර

උද්ධං අධෝ ච තිරියං ච අප්පමාණං අවේරං අසපත්තං යන්න හෝ උඩ යට හරහා යන කිසිම දිසාවක වෛරයක් සතුරුබවක් නොමැති සේ යන සිංහල අදහස හෝ පිළිතුර ලෙස ලියා තිබිය යුතුය.

උපදෙස්

ඉහත පිළිතුර සිංහලෙන් හෝ පාලියෙන් හෝ ලියා තිබේ නම් ලකුණු 01ක් ප්‍රදානය කරන්න

නිවැරදි පිළිතුරට (අ) කොටසට ලකුණු 02ක් ද (ආ) කොටසට ලකුණු 01ක් ද වශයෙන් ප්‍රදානය කළ හැකි මුළු ලකුණු ගණන 03කි.

(ix) (අ) ගස් කැපීම කොළ කැඩීම පැළවෙන බීජවලට හානි පැමිණවීම යන කරුණු භික්ෂු ප්‍රාතිමෝක්ෂයේ කවර ආපත්තියකට අයත්වේදැයි නම්කරන්න.

පිළිතුර

පාචිත්තිය ආපත්තියට

උපදෙස්

ඉහත පිළිතුර සපයා තිබේ නම් ලකුණු 01ක් ප්‍රදානය කරන්න.

(ආ). එසේ කිරීම ආපත්තියක් ලෙස පැණවීමෙන් අපේක්ෂා කරන ලද්දේ කවර සම්පතක් යක ගැනීමට ද?

(ලකුණු 02යි)

පිළිතුර

පරිසරය නැමති සම්පත

උපදෙස්

ඉහත පිළිතුර දක්වා තිබේ නම් ලකුණු 01ක් ප්‍රදානය කරන්න.

නිවැරදි පිළිතුරට (අ) කොටසට ලකුණු 01ක් ද (ආ) කොටසට ලකුණු 01ක් ද වශයෙන් ප්‍රදානය කළ හැකි මුළු ලකුණු ගණන 02කි.

(x) (අ) බ්‍රාහ්මණෝස්‍ය මුඛමාසීත් යන ශ්ලෝකය සම්පූර්ණ කර ලියන්න.

පිළිතුර

බ්‍රාහ්මණෝඃස්‍ය මුඛමාසීත් - බාහු රාජන්‍යඃ කෘතඃ

ඌරූ තදස්‍ය යද් වෛශ්‍යඃ - පද්භ්‍යාම් ශූද්‍රෝ අජායත

උපදෙස්

සම්පූර්ණ ශ්ලෝකය ලියා තිබේ නම් අක්ෂරවින්‍යාසය සැලකිල්ලට නොගෙන ලකුණු 01ක් ප්‍රදානය කරන්න.

(ආ) මේ ශ්ලෝකයෙන් ප්‍රකට වන්නේ බ්‍රාහ්මණයන්ගේ කවර මිථ්‍යා මතය ද?

(ලකුණු 02යි)

පිළිතුර

බ්‍රාහ්මයා සමාජ ස්ථර මැවුවේය යන මතය

උපදෙස්

මේ කරුණ දක්වා තිබේ නම් ලකුණු 01ක් ප්‍රදානය කරන්න.

නිවැරදි පිළිතුරට (අ) කොටසට ලකුණු 01ක් ද (ආ) කොටසට ලකුණු 01ක් ද වශයෙන් ප්‍රදානය කළ හැකි මුළු ලකුණු ගණන 02කි.

11කොටස

2.ප්‍රශ්නය

(i) භාරතීය සමාජස්තරායණය තුළ පැවැති වර්ණ භේදයට අනුව 'ද්විජ' යන නමින් හඳුන්වනු ලැබූ වර්ණ සංඛ්‍යාව කීය ද? ඒවා නම්කරන්න.

(ලකුණු 04යි)

පිළිතුර

(i) *තුනයි.*

(ii) *බ්‍රාහ්මණ වර්ණය ක්ෂත්‍රිය වර්ණය හා වෛශ්‍ය වර්ණය*

උපදෙස්

සංඛ්‍යාව දැක්වීමට ලකුණු 01ක් ද වර්ණ තුන නම්කිරීමට ලකුණු 03ක් ද බැගින් ලකුණු 04ක් ප්‍රදානය කරන්න.

(ii) ආර්ථික අසමානතා නිසා සමාජයක ඇතිවිය හැකි ස්තර නම්කරන්න. (ලකුණු 07යි)

පිළිතුර

දුප්පත් පංතිය, පොහොසත් පංතිය/ ධනවත් පන්තිය, නිර්ධන පන්තිය/ ඇතිහැකි පන්තිය, නැතිබැරි පන්තිය වැනි පිළිතුරක් අපේක්ෂිතයි.

උපදෙස්

පන්ති දෙකක් නම්කර තිබේ නම් ලකුණු 07ක් ප්‍රදානය කරන්න.

(iii) 'වරප්‍රසාද හා ලාභ ප්‍රයෝජන ලැබීම අරමුණු කරගත් විවිධ සමාජ ස්තර සම අයිතිවාසිකම් භුක්ති විඳීමේ අයිතියට බාධා පමුණුවයි.' යන ප්‍රකාශය පරීක්ෂාවට ලක් කරන්න. (ලකුණු 07යි)

පිළිතුර

බ්‍රහ්මනිර්මාණවාදය මත ගොඩනඟා ගත් සමාජ ස්ථරවලින් එදා සමාජයේ ජනයාට සම අයිතිවාසිකම් භුක්ති විඳීමේ අයිතියට බාධා පැමිණි ආකාරය හෝ වර්තමාන සමාජක්‍රමවල ඇති ස්ථරවලින් සම අයිතිවාසිකම් භුක්තිවිඳීමේ අයිතියට බාධා පැමිණි ආකාරය හෝ විස්තර කරමින් සපයන ස්වාධීන පිළිතුරක් අපේක්ෂිතයි.

උපදෙස්

කව්රාකාර හෝ සමාජ ස්තර පාදක කොට ගනිමින් සපයන ප්‍රමාණවත් පිළිතුරකට ලකුණු 07ක උපරිමයට යටත් ව සුදුසු ලකුණක් ප්‍රදානය කරන්න.

3. ප්‍රශ්නය

(i) යහපත් භාර්යාවන් සිවුදෙනා නම් කරන්න. (ලකුණු 04යි)

පිළිතුර

මාතු සම භාර්යාව, භගිනි සම භාර්යාව, සඛි සම භාර්යාව, දාසි සම භාර්යාව යන්න හෝ එම අදහස පැවසෙන සමාන පිළිතුරක් සැපයිය යුතුය.

උපදෙස්

එක් නම්කිරීමකට ලකුණු එක බැගින් සිවුදෙනා නම්කිරීමට ලකුණු 04ක් ප්‍රදානය කරන්න.

(ii) විවාහක බෞද්ධ ගිහිපා දෙවියන්ගේ වැඳුමට නිසි වන්නේ කවර ලක්ෂණ සම්පූර්ණ කළ විටදැයි පැහැදිලි කරන්න. (ලකුණු 07යි)

පිළිතුර

යේ ගහට්ඨා කම්මකරා - සීලවන්තා උපාසකා
ඛම්මේන දාරං පොසෙන්ති - නං නමස්සාමි මානලී

යන සක්දෙවියන් මානලිට පැවසූ ගාථාවේ අන්තර්ගත කරුණු වන

(i) *යහපත් කර්මාන්තවලින් ධනය ඉපයීම,* (ii) *සීලවන්ත භාවය,*

(iii) *බෞද්ධඋපාසකයෙකු වීම,* (iv) *දැහැමින් ජීවත්වීම හා*

(v) *දැහැමින් අඹුදරුවන් පෝෂණය කිරීම යන කරුණු විස්තර වන පේ සැපයෙන පිළිතුරක්*

අපේක්ෂිතයි.

උපදෙස්

ඉහත කරුණු ඇතුළත් ප්‍රමාණවත් පිළිතුරකට ලකුණු 07ක උපරිමයට යටත් ව සුදුසු ලකුණක් ප්‍රදානය කරන්න.

(iii) ගෘහස්ථ සංස්කෘතියෙහි අංගයක් වන විවාහ ජීවිතය සාර්ථක කරගැනීමට බුදු දහම සපයන උපදෙස් පැහැදිලි කරන්න. (ලකුණු 07යි)

පිළිතුර

විවාහ ජීවිතය ගෘහස්ථ සංස්කෘතියෙහි අංගයක් බෙව බුදු දහම පිළිගන්නා බව දක්වා සාර්ථක විවාහ ජීවිතයකට අඹු-සැමි උභය පක්ෂය විසින් ම තම යුතුකම් හා වගකීම් පිළිබඳව අවබෝධයෙන් යුතුව කටයුතු කළ යුතු ආකාරය සඳහා නමස්කාරයෙහි පැහැදිලි කොට ඇති ආකාර විස්තර කොට සාර්ථක විවාහ ජීවිතයක් දේවපුත්‍රයෙක් දෙවුදුවක හා විසීමට සමකොට ඇති බවත් ද විවාහය සාර්ථක වීමට මාතු සම භාගිනි සම සඛි සම දාසි සම භාර්යාවන් සේ සැකැස් විය යුතු බවට උපදෙස් දී ඇති බවත් ද සද්ධා සීල චාග පඤ්ඤා යන ගුණ ධර්ම දෙදෙනා වෙන ම ඇති විට විවාහය සාර්ථක වන බවත් පෙන්වා දී ඇති බව ද නකුලමාතා නකුලපිතා වැනියන් බුදු සමයෙහි අකය කර ඇති ආකාරය ද ලෝකාස්වාදු රතියෙන් තෘප්තිමත් නොවීම විපතට පත්වීමට හේතු වන අන්දම අසාකමන්තු ජාතකය ආදියෙන් පෙන්වා දී ඇති බව ද පිළිතුරෙන් පැහැදිලි කළ හැකිය.

උපදෙස්

ප්‍රමාණවත් ලෙස කරුණු ඉදිරිපත් කර තිබෙන පිළිතුරකට ලකුණු 07ක උපරිමයට යටත් ව ලකුණු ප්‍රදානය කළ හැකිය.

4 ප්‍රශ්නය

(i) සතර බඹවිහරණ නම්කරන්න. (ලකුණු 04යි.)

පිළිතුර

මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා.

උපදෙස්

නිවැරදි පිළිතුරට ලකුණු 04ක් ප්‍රදානය කරන්න.

(ii) ස්වභාව ධර්මයේ සමතුලිත බව බිඳවැටීමට හේතුවන කරුණු තුනක් නම්කරන්න. (ලකුණු 07යි)

පිළිතුර

අධර්මරාගය, විෂම ලෝභය හා මිථ්‍යාදෘෂ්ටිය පැනිරීම

උපදෙස්.

එක් කරුණකට ලකුණු දෙක බැගින් ප්‍රදානය කරන්න. කරුණු තුන ම දක්වා තිබේ නම් ලකුණු 07 ම ප්‍රදානය කරන්න.

(iii) 'ජීව අජීව පරිසරය හේතුඵල සම්බන්ධතාවෙන් යුතු සමුච්චයක් නිසා පරිසරය සංරක්ෂණය සඳහා

'සමතුලිත අන්තර් ක්‍රියාදාමයක් පවත්වා ගත යුතුය' යන ප්‍රකාශය තහවුරු කරන්න. ලකුණු 07යි

පිළිතුර

සියලු ම ජීව අජීව පද්ධති එකිනෙකට බැඳී පවතින හේතුඵල සන්තතියක් ලෙස පවතින බව වටහා ගෙන අධර්ම රාගය විෂම ලෝභය හා මිථ්‍යාදෘෂ්ටිය සමග බැඳුණු ක්‍රියාකාරකම් නිසා පරිසර පද්ධතියේ සමතුලිත බව බිඳවැටී පාරිසරික විනාශය සිදුවන බවත් මෙන්නා කරුණා මුදිතා උපෙක්ඛා යන සතර මඛ්විහරණ පදනම් කොට ගෙන සංවිධානය කරන යහපත් ක්‍රියාකාරකම් පරිසර සංරක්ෂණයට හේතුවන බවත් එබඳු ක්‍රියාදාමයක් පවත්වා ගෙන යා යුතු බවත් පැහැදිලි කරන පිළිතුරක් අපේක්ෂා කෙරේ.

උපදෙස්

උපරිමය ලකුණු 07ක් සේ ගෙන ප්‍රමාණවත් පිළිතුරක්දැයි විමසා සුදුසු ලකුණක් ප්‍රදානය කරන්න.

5 ප්‍රශ්නය

(i) ජයං වේරං පසවති යන් ගාථාව සම්පූර්ණ කර ලියන්න. (ලකුණු 04යි)

පිළිතුර

ජයං වේරං පසවති - දුක්ඛං සේති පරාජිතෝ
උපසන්තෝ සුඛං සේති - හිත්වා ජය පරාජයං.

උපදෙස්

අක්ෂර විත්‍යාස දෝස සැලකිල්ලට නොගෙන සම්පූර්ණ ගාථාව ලියා තිබේ නම් ලකුණු 04 ක් ප්‍රදානය කරන්න.

(ii) සාමය සඳහා පදනම් වන මානසික ස්වභාවය වර්ධනය කිරීමට උපකාරවන භාවනා දෙකක් නම්කරන්න. (ලකුණු 07යි)

පිළිතුර

මරණානුස්මෘති භාවනාව, මෛත්‍රී භාවනාව.

උපදෙස්

එක් භාවනාවක් නම්කර ඇත්නම් ලකුණු 04ක් ද දෙක ම නම්කර ඇත්නම් ලකුණු 07ක් ද ප්‍රදානය කරන්න.

(iii) යුද්ධයෙන් තොර ව සාමයෙන් සැනපෙන ලොවක් තැනීමට බුදු සමයෙන් ලැබෙන උපදෙස් පැහැදිලි කරන්න. (ලකුණු 07යි)

පිළිතුර

සබ්බේ තසන්ති දණ්ඩස්ස - සබ්බේසං ජීවිතං පියං, අත්තානං උපමං කත්වා - න හනෙය්‍ය න ඝාතයේ යන උපදේශය ද අත්තූපමාය සබ්බේසං සත්තානං සුඛකාමතං පස්සිත්වා කමතෝ මෙත්තං සබ්බ සත්තේසු භාවයේ යන උපදේශය ද මේ සඳහා දී ඇති මූලික උපදෙස්ය. සූන්‍යතාව වටහා ගෙන මමත්වයෙන් මිදී මානයෙන් තොරවීමෙන් ඝාතනචේතනාව ඉවත්වීමට ඇති ඉඩ සැහැලින් ම නැති කළ හැකිය. මරණානුස්සතිය මෛත්‍රී භාවනාව ආදිය වැඩීමෙන් ද ඝාතන චේතනාව නැති කළ හැකිය. යුද්ධයෙන් ලබන ජය තාවකාලික බව වටහා ගැන්ම ද නිගින දණ්ඩ

ඇයිනිවාසිකම් ඉටුවන විට සමාජයේ මනා පැවැත්මක් ඇතිවන අන්දම පැහැදිලි කරන පිළිතුරක් අපේක්ෂා කෙරේ.

උපදෙස්

ප්‍රමාණවත් කරුණු සහිත විචාරාත්මක පිළිතුරකට ලකුණු 07ක උපරිමයට යටත් ව සුදුසු ලකුණක් ප්‍රදානය කළ හැකිය.

7 ප්‍රශ්නය

(i) දසරාජ ධර්මය නම්කරන්න. (ලකුණු 04යි)

පිළිතුර

දානං සීලං පරිච්චාගං - අජ්ජවං මද්දවං තපං
අක්කෝධෝ අවිහිංසා ච - ඛන්ති ච අවිරෝධනා යන ගාථාව දැක්වීම හෝ ගාථාවෙන් දැක්වෙන කරුණු දහය නම්කිරීම කළ යුතුය.

උපදෙස්

කරුණු තුනකට ලකුණු 01ක් ද කරුණු හයකට ලකුණු 02ක් ද කරුණු නවයකට ලකුණු 03ක් ද දහය ම තිබේ නම් ලකුණු 04ක් ද ප්‍රදානය කරන්න.

(ii) රාජ්‍යත්වය පිළිබඳ බෞද්ධ සංකල්පය හා බ්‍රාහ්මණික සංකල්පය අතර ඇති අසමානතා හතරක් නම්කරන්න. (ලකුණු 07යි)

පිළිතුර

(i) බ්‍රාහ්මණ මතය අනුව රජුපදවිය යුද්ධ කිරීම සඳහා පහළ විය. බෞද්ධ මතය රාජ්‍යත්වය අපරාධ මර්දනයට පහළ වූ බවයි.
(ii) බ්‍රාහ්මණ මතය අනුව රජුගේ පරම යුතුකම දික්විජයයයි. බෞද්ධ මතය වන්නේ රජුගේ පරම යුතුකම සාමය පවත්වාගෙන යෑම බවයි.
(iii) බ්‍රාහ්මණ මතය අනුව රජුපදවිය ස්වධර්මය මත වර්ණභේදය අනුව ලබන්නකි. බෞද්ධ මතය වන්නේ රජුපදවිය සාමාජික ආර්ථික අවශ්‍යතා මත පහළ වූ බවයි.
(iv) බ්‍රාහ්මණ මතය වන්නේ රජුපදවිය දේව වරමින් ලබන බවයි. බෞද්ධ මතය වන්නේ, රජුපදවිය මහාසම්මතයෙන් ලබන බවයි.

උපදෙස්

එක් අසමානතාවක් දක්වා තිබේ නම් ලකුණු 04ක් ද දෙකක් දක්වා තිබේ නම් ලකුණු 05ක් ද තුනක් දක්වා තිබේ නම් ලකුණු 06ක් ද හතර ම දක්වා තිබේ නම් ලකුණු 07ක් ද ප්‍රදානය කරන්න.

(iii) මතා රාජ්‍ය පාලනයක් පවත්වා ගැනීමට බුදු සමය සපයන උපදෙස් විස්තර කරන්න. (ලකුණු 07යි)

පිළිතුර

(i) පරමාදර්ශී රාජ්‍ය සංකල්පයක් ලෙස චක්‍රවර්ති රාජ්‍ය පාලකයෙකුගේ ලක්ෂණ හඳුන්වාදීම
(ii) තෘෂ්ණාවෙන් මෙහෙයවනු ලබන නිසා නොමරමින් නොමරවමින් නොදිනමින් නොදිනවමින් රජ්‍යයක් කළ නොහැකිබව දක්වමින් රජ්ජුස්සුතුයේ අවධාරණය කරණ මනා පාලනයක් සඳහා තෘෂ්ණාවෙන් මිදුණු සමාජයක අවශ්‍යතාව

නිහින සත්ථ ලජ්ජි දයාපන්න මනෝ නමුත්නාවක් ඇති කරගැනීම ද යුද්ධයට ඇති ඉඩ අවුරයි. යනාදී කරුණු ඇතුළත් නිදහස් පිළිතුරක් අපෙක්ෂිතයි.

උපදෙස්

සමස්තයක් ලෙස සලකා ඉහත දැක්වුණු කරුණු ඇතුළත් වන සේ සපයන සාරවත් පිළිතුරකට ලකුණු 07ක උපරිමයට යටත් ව සුදුසු ලකුණක් ප්‍රදානය කරන්න.

6 ප්‍රශ්නය

(i) සදිසාවට සම්බන්ධ කර ඇති පුද්ගලයන් නම්කරන්න. (ලකුණු 04යි)

පිළිතුර

නැගෙනහිර - මවුපියෝ දකුණ - ආචාර්යවරු බටහිර - අඹු සැමියෝ උතුර - මිතුරු-ඇමතියෝ යට - දාස කම්කරුවෝ උඩ - මහණ බමුණෝ. යනුවෙන් දිසාවන් පුද්ගලයන් දෙක ම දක්වා තිබිය යුතුය. (4)

මාතා පිතා දිසා පුබ්බා - ආචරියා දක්ඛිණා දිසා යන ගාථාව ලියා ඇතත් නිවැරදි පිළිතුර සේ ගත හැකිය.

උපදෙස්

ඉහත පිළිතුර හෝ ගාථාව හෝ ලියා තිබේ නම් ලකුණු 04ක් ප්‍රදානය කරන්න. අක්ෂර වින්‍යාසය පිළිබඳ ඌනතා සැලකිය යුතු නැත.

(ii) මිතුරෙකු විසින් තම මිතුරාට කළ යුතු සංග්‍රහ සහ ඔහුගෙන් එසේ සංග්‍රහ කරන මිතුරාට ඉටුවිය යුතු යුතුකම් නම්කරන්න. (ලකුණු 07යි)

පිළිතුර

(i) *පරිත්‍යාග කිරීම* (ii) *ප්‍රියවචනය*

(iii) *දියුණුවට අනුබල දීම(අර්ථචරියාව)* (iv) *සමානත්වයෙන් සැලකීම* (1)

(v) *අවංකබව (අවිසංවාදනා)*

සහ

(i) *ප්‍රමාදීව - වැරදි ලෙස- කටයුතු කරන විට ආරක්ෂා කිරීම*

(ii) *එසේ කරන විට ධනය රැකදීම* (iii) *භයක් ඇතිවූ විට රැකීම*

(iv) *ආපදාවක දී අත් නොහැරීම* (v) *පවුලේ අයට ද සංග්‍රහ කිරීම* (3)

උපදෙස්

පළමු කරුණු පහ දැක්වීමට ලකුණු 04ක් අනෙක් කරුණු පහ දැක්වීමට ලකුණු 03ක් ද වශයෙන් ලකුණු 07ක උපරිමයට යටත් ව සුදුසු ලකුණක් ප්‍රදානය කරන්න.

(iii) මෙහා යමාජ පැවැත්මක් සඳහා සදිසා නමස්කාරය උපකාර කරගත හැකි ආකාරය පැහැදිලි කරන්න (ලකුණු 07යි)

පිළිතුර

සදිසා නමස්කාරයෙන් පෙන්වන සාමාජික බන්ධනවලට අයත් එකිනෙකාගේ යුතුකම් හා

(iii) මූලික මිනිස් අයිතිවාසිකම් ආරක්ෂා කරමින් සාමය පවත්වාගනිමින් කටයුතු කරනජනසම්මතය ලත් රජෙකුගේ අවශ්‍යතාව

(iv) රජු දසරාජධර්මයෙන් යුක්තයෙකු වීමේ අවශ්‍යතාව,

(v) ධනරහිතයන්ට ආයෝජනය සඳහා ධනය දෙන්නෙකුවීම,

(vi) අවනත අන්‍ය රටවල්වලට ස්වාධීන ව පාලනයට ඉඩ සලසමින් දැහැමින් පාලනය කිරීමට සහාය හා උපදෙස් දීම,

(vii) රටේ අපරාධ මර්දනය,

(viii) ධාර්මික පාලනයක් ගෙනහැම ආදි අංශ සඳහා දෙන උපදෙස් ඇතුළත් පිළිතුරක් අපේක්ෂා කෙරේ.

උපදෙස්

ප්‍රමාණවත් කරුණු ඇතුළත් විචාරාත්මක තර්කාණුකූල පිළිතුරකට උපරිමය ලකුණු 07ක් ලෙස සලකා සුදුසු ලකුණක් ප්‍රදානය කළ හැකිය.

8 ප්‍රශ්නය

(i) එකේන හොගේ භුඤ්ජෙය්‍ය යන ගාථාව සම්පූර්ණ කරන්න. (ලකුණු 04යි)

පිළිතුර

එකේන හෝගේ භුඤ්ජෙය්‍ය - ද්වීහි කම්මං පයෝජයේ
චතුත්ථං ච නිධාපෙය්‍ය - ආපදාසු භවිස්සති.

උපදෙස්

ගාථාව සම්පූර්ණයෙන් ලියා ඇත්නනම් ලකුණු 04ක් ප්‍රදානය කරන්න.

(ii) බුදුරදුන්ගෙන් ආර්ථික උපදෙස් විමසූ දීඝජානු කෝලිය පුත්‍රයාට දෙසන ලද සූත්‍ර දේශනාව කවරේදැයි සඳහන් කර එහි ඇතුළත් මූලික කරුණු කවරේදැයි නම්කරන්න. (ලකුණු 07යි)

පිළිතුර

(i) *වසග්ඝපජ්ජ සූත්‍රය*

(ii) *උට්ඨාන සම්පදා, ආරක්ඛ සම්පදා, කල්‍යාණමිත්තතා, සමජීවිකතා යන සම්පදා සතරත්*

(iii) *අපායමුඛ හතරත් අයමුඛ සතරත් මෙලොව යහපතට ද*

(iv) *සද්ධාසම්පදා සීලසම්පදා චාගසම්පදා,පඤ්ඤා සම්පදා පරලොව යහපතට ද දේශනා කර ඇත.*

උපදෙස්

සූත්‍රය නම්කිරීමට ලකුණු 01ක් ද මෙලොව දියුණුවට හේතුවන සම්පදා හතර දැක්වීමට ලකුණු 02ක් ද අයමුඛ අපායමුඛ නම්කිරීමට ලකුණු 02ක් ද පරලොව දියුණුවට හේතුවන කරුණු හතර නම්කිරීමට ලකුණු 02ක් ද වශයෙන් ලකුණු 07ක් ප්‍රදානය කරන්න.

(iii) 'ශ්‍රම අභිමානය රැකගනිමින් වැඩ කිරීමට උපදෙස් දෙන බුදු දහම දැහැමි ආර්ථික ප්‍රතිපත්ති සමුදායක් ඉදිරිපත් කරයි' යන ප්‍රකාශය තහවුරු කරන්න. (ලකුණු 07යි)

පිළිතුර

අංගුත්තර නිකායේ එන අභිමානයෙන් යුතුව උට්ඨාන වීර්යයෙන් වැඩ කිරීමට දෙන උපදෙස් අට

දක්වා (බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්මය නිවැරදි ලෙස අවබෝධ කරගැනීමට හේතු වන ධර්මය) අධාර්මික වෙළෙඳාමේ අධාර්මික මිනුම් භාවිත කරන වංචනික ක්‍රියා ආදිය අන්තර්ගත ආර්ථික ක්‍රියාමාර්ගයක් බුදු දහම ඉකිරිපත් කන අයුරු විස්තර කරන පිළිතුරක් අපේක්ෂිතයි.

උපදෙස්

ශ්‍රමාභිමාණය පිළිබඳ කරුණු දැක්වීමට ලකුණු 03ක් ද සෙසු කරුණුවලට ලකුණු 04ක් ද වශයෙන් සලකා ගෙන ප්‍රමාණවත් පිළිතුරකට සුදුසු ලකුණු ප්‍රදානය කරන්න

9. ප්‍රශ්නය

(i) ආර්ථික දියුණුවට උපකාර වන සම්පදා හතර නාමකරන්න. ලකුණු 04යි

පිළිතුර

උට්ඨාන සම්පදා, ආරක්ඛ සම්පදා, කල්‍යාණමිත්තතා, සමජීවිකතා.

උපදෙස්

එක් කරුණකට එක් ලකුණ බැගින් ලකුණු 04ක් ප්‍රදානය කරන්න.

(ii) ආරක්ඛ සම්පදාව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 07යි)

පිළිතුර

උපයාගත් සම්පත් නැණවන්ව ප්‍රවේශමෙන් පරිහරණය කිරීම ආරක්ඛ සම්පදාවයි. නාස්තිය මෙන් ම පරිහරණය නො කිරීමත් ආරක්ඛ සම්පදාවට පටහැනිය. උදුම්බරාදික අපද්ධුමරණ යන සංකල්ප දෙකෙන් මිදී දිවි රැක ගැනීම ද පරිහරණය ද කිරීම ආරක්ඛ සම්පදාවේ ලක්ෂණයයි. (7)

උපදෙස්

ප්‍රමාණවත් පිළිතුරකට ලකුණු 07ක උපරිමයට යටත්ව සුදුසු ලකුණක් ප්‍රදානය කරන්න.

(iii) දැනුම් තුළනාත්මක කෘෂ්තිමත් ආර්ථිකයක් පවත්වා ගැනීමට බුදුසමය දෙන උපදෙස් විස්තර කරන්න. ලකුණු 07යි

පිළිතුර

බුදු සමයේ දැක්වෙන ආර්ථික උපදෙස් ඉහත දැක්වෙන ප්‍රකාශය තහවුරු වන අයුරින් ඉදිරිපත් කරන පරිකල්පනාත්මක පිළිතුරක් අපේක්ෂිතයි.

උපදෙස්

ප්‍රමාණවත් පිළිතුරකට ලකුණු 07ක උපරිමයට යටත්ව සුදුසු ලකුණක් ප්‍රදානය කරන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

2554 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2009 (2010)

S 5

පැ තුනයි

(05) බෞද්ධ සමාජ දර්ශනය

I කොටසේ එන පළමු ප්‍රශ්නය ද, II කොටසින් තෝරා ගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළත් වන සේ ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

සැ.යු. I කොටසේ ප්‍රශ්න වලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම ලියා, II කොටසේ පිළිතුරු සමඟ අමුණා ශාලාධිපතිට භාර දෙන්න.

විභාග අංකය: .....

I කොටස

1. (i) (අ) බෞද්ධ සමාජයක සාමාජිකයෙකු බවට පත්විය හැක්කේ කවර ප්‍රතිඥාවක් දීමෙන් දයි නම් කරන්න.

.....

(ආ) එම ප්‍රතිඥා පාඨ පිළිවෙළින් ලියන්න.

.....

.....

.....

(ලකුණු 02)

(ii) (අ) බෞද්ධ සමාජයක් අර්බුදවලින් තොරව මනාව පවත්වාගෙන යාම යදහා එහි සාමාජිකයන් විසින් ඉටු කළ යුතු යුතුකම් රැසක් සිගාලෝවාද සූත්‍රයෙහි දක්වේ. ඒ අතර ශිෂ්‍යයෙකු වෙත පවරා තිබෙන යුතුකම් නම් කරන්න.

.....

.....

(ආ) එහි ගුරුවරයෙකු වෙත පැවරෙන යුතුකම් ද දක්වා ඇත. එකී යුතුකම් ද නම් කරන්න.

.....

.....

.....

(ලකුණු 02)

(iii) (අ) සමාජ පරිණාමයට හේතු වන මිනිස් ස්වභාව තුනක් අග්ගඤ්ඤ සූත්‍රයේ දක්වේ. එම ස්වභාව තුන නම් කරන්න.

.....

.....

.....

(ආ) පෞද්ගලික අයිතිය පිළිබඳ සංකල්පය වර්ධනය වීම නිසා සමාජය තුළ ඇති වූ අයහපත් ලක්ෂණ දෙකක් නම් කරන්න.

.....

.....

(ලකුණු 03)

(iv) (අ) ශක්‍ර දේවේන්ද්‍රයන් මාතලි දිව්‍යපුත්‍රයාට පැවසූ 'යෙ ගහට්ඨා පුඤ්ඤකරා' යන ගාථාව සම්පූර්ණ කර ලියන්න.

.....

.....

(ආ) එහි දක්වෙන බෞද්ධ උපාසකයෙකු තුළ දකිය හැකි ප්‍රධාන ලක්ෂණ තුන නම් කරන්න.

.....

.....

.....

(පිටුපසයි)

[ඊ එකසු අවුරුදු හතරක්

Scanned by CamScanner

(v) (අ) නකුලමාතා සහ නකුලපිතා බෞද්ධ සාහිත්‍යයේ දක්වෙන්නේ කවර කරුණකින් විශේෂවූවන් ලෙසද?

.....

.....

(ආ) මවුන් දෙදෙනා තුළ සම මට්ටමින් පැවති උතුම් ගති ලක්ෂණ **හතර** නම් කරන්න.

.....

.....

.....

.....

.....

(ලකුණු 03)

(vi) (අ) 'සබ්බේ තයන්ති දණ්ඩස්ස' යන ගාථාව සම්පූර්ණ කර ලියන්න.

.....

.....

.....

(ආ) යුද්ධය ඇති වීමට හේතු වන මූලික මානසික හේතු **හතරක්** නම් කරන්න.

.....

.....

.....

.....

.....

(ලකුණු 03)

(vii) (අ) 'ජයං වෙරං පසවති' යන ගාථාව සම්පූර්ණ කර ලියන්න.

.....

.....

.....

(ආ) පරාජිතයෙකුගේ සිතෙහි ජනිත විය හැකි සිතුවිලි නම් කරන්න.

.....

.....

.....

(ලකුණු 03)

(viii) (අ) සමාජ සුරක්ෂිතතාව සඳහා බෞද්ධයෙකු විසින් සිය කැමැත්තෙන්ම ප්‍රතිඥා දී පිළිපදින සදාචාරධර්ම පද්ධතිය නම් කරන්න.

.....

.....

(ආ) එම සදාචාරධර්ම පිළිවෙළින් නම් කරන්න.

.....

.....

.....

(ලකුණු 03)

(ix) (අ) ආනන්ද හිමියන්ට පූජා දායකයෙන් සිවුරු පහයියක් පැහුණු අවස්ථාවේ එවැනි [illegible] කියන [illegible]. ඒ කවුරු [illegible] ඇත්තේ?

.....

.....

.....

(ආ) ධනය කොටස් හතරකට බෙදා ඒ ඒ කාර්යවල යෙදවිය යුතු බවට බෞද්ධයාට උපදෙස් දී ඇත. එසේ කවර ප්‍රමාණයේ කොටස් කවර කාර්යවල යෙදවිය යුතු ද යන්න කෙටියෙන් දක්වන්න.

.....

.....

.....

(ලකුණු 03)

(x) (අ) [illegible] වෙනුවෙන් [illegible] සූත්‍රයේ දැක්වේ. ඉන් [illegible] නම් කරන්න.

.....

.....

(ආ) අසිපත්‍රවනයට [illegible] පහක් බෞද්ධ සාහිත්‍යයේ දක්වේ. ඉන් [illegible] නම් කරන්න.

.....

.....

(ලකුණු 03)

Scanned by CamScanner

2554 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2009 (2010)

S 5

(05) - බෞද්ධ සමාජ දර්ශනය

(ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.)

II කොටස

2. (i) බෞද්ධ සමාජයක සිටින ප්‍රධාන පිරිස් හතර නම් කර ඒ පිරිස් තැවත මූලික කොටස් දෙකකට බෙදා දක්වන්න. (ලකුණු 04)

(ii) සිඟාලෝවාද සූත්‍රයට අනුව බෞද්ධ ගිහි ශ්‍රාවකයෙකුට පැවරෙන වගකීම් නම් කර ගමේ විහාරස්ථානයේ භික්ෂූන් වහන්සේලාට මඟ විසින් කවර අනුග්‍රහයක් ලබා දිය යුතු දැයි පැහැදිලි කරන්න. (ලකුණු 07)

(iii) සිඟාලෝවාද සූත්‍රයෙහි එන පැවිදිපක්ෂයේ යුතුකම් නම්කර භික්ෂූන් වහන්සේ වෙතින් ඔබේ ආර්ථික සාමාජික හා අධ්‍යාත්මික දියුණුවට ලැබෙන සහාය ඇගයීමට ලක් කරන්න. (ලකුණු 07)

3. (i) සමාජ සංස්ථාවල ප්‍රභවය හා පරිණාමය පිළිබඳ බෞද්ධ මතය දක්වෙන සූත්‍ර දේශනාව නම් කරන්න. (ලකුණු 04)

(ii) එහි දක්වෙන අන්දමට පෘථිවිය, සත්වයා, චතුර්වර්ණය පාලකයා හා අධිකරණ යන ඒවායේ ප්‍රභවය වූ හා පරිණාමය වූ ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 07)

(iii) පරමාදර්ශී සමාජයක් ගොඩනඟා ගැනීමට නම් බුදුසමය දෙන උපදෙස් ප්‍රායෝගිකව අනුගමනය කළ යුතුය යන ප්‍රකාශය විමසීමට ලක් කරන්න. (ලකුණු 07)

4. (i) ගෘහස්ථ බ්‍රහ්මචර්යාව යනු කුමක්ද? (ලකුණු 04)

(ii) විවාහ ජීවිතය ගෘහස්ථ සංස්කෘතියෙහි වැදගත් අංගයක් බව පිළිගන්නා බුදුදහම එහි සාර්ථකත්වය සඳහා උපදෙස් සපයයි යන කියමන තහවුරු කරන්න. (ලකුණු 07)

(iii) විවාහ ජීවිතයට අදළ උපස් ගුණ ධර්ම ප්‍රගුණ කිරීම සමාජ යහපතට ද, නිර්වාණ ලාභයට ද හේතුවේ යන කියමන පරීක්ෂා කරන්න. (ලකුණු 07)

5. (i) භාරතීය සමාජයේ බුද්ධ කාලයෙහි දක්නට ලැබුණු ආගමික කණ්ඩායම් හතරක් නම් කරන්න. (ලකුණු 04)

(ii) ආගමික දර්ශනයෙහි මතු කළ හැකි සියලු ආකාරයේ ම අදහස් බුද්ධකාලීන ආගමිකයන් විසින් මතු කර තිබිණි යන ප්‍රකාශය තහවුරු කරන්න. (ලකුණු 07)

(iii) සාමාජික සහජීවනයට ඉඩ සලසන ආගමක් ලෙස බුදුදහම පෙරමුණ ගනියි යන කියමන පරීක්ෂාවට ලක් කරන්න. (ලකුණු 07)

6. (i) 'අක්කොසිපි මං අවධි මං' යන ගාථාව සම්පූර්ණ කර ලියන්න. (ලකුණු 04)

(ii) යුද්ධයෙන් තොර ලෝකයක් සඳහා මිනිස් පියවෙන් පහ කළ යුතු සිතුවිලි නම්කර බුදු දහම පාමය රජයන ලෝකයක් ගොඩනැඟීම සඳහා දරන ප්‍රයත්නය පරීක්ෂාවට ලක් කරන්න. (ලකුණු 07)

(iii) ලංකා සමාජයේ ස්ථීර සාමයක් ඇති කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග කවරේදැයි විමසන්න. (ලකුණු 07)

7. (i) නිති පැනවීමේ පදනම ලෙස සැලකිය හැකි කරුණු හයක් නම් කරන්න. (ලකුණු 04)

(ii) 'බෞද්ධ චක්‍රවර්ති රාජ්‍යයේ නීතියේ ස්වභාවය පැහැදිලි කිරීමට බලය අයත් ආයතන ලෙසින් ගැනෙන්නේ, නීතිය අධිකරණය කෙරෙහි ද්‍රව්‍ය අධිනිවාදියාගේ අතිනි නොවේ. එහා ප්‍රතික්ෂේප කිරීමෙන්ට ලක් කරන්න. (ලකුණු 07)

(iii) නීති විරහිත සමාජයක් ඇතිවිය නොහැකිය යන කියමනට අනුකූල හා විපක්ෂව කරුණු දක්වන්න. (ලකුණු 07)

8. (i) ආර්ථික ක්‍රියාවලිය හැඩගසා ගැනීමට උපදෙස් දෙන ප්‍රධාන සූත්‍ර දේශනා දෙක නම් කර එම සූත්‍ර දේශනා කරන්නේ කවුරුන්වදයි නම් කරන්න. (ලකුණු 04)

(ii) මූලික අවශ්‍යතා විමසුම් තුවණින් යුතුව පිරිමසා ගැනීමෙන් ආර්ථික ගැටලු නිරාකරණයටත් ආශ්වක්ෂයකර ගැනීමටත් මග පෑදේ යන කියමන පරීක්ෂා කරන්න. (ලකුණු 07)

(iii) ආයෝජනය, නිෂ්පාදනය, පරිභෝජනය, ඉතිරිකිරීම යන ක්ෂේත්‍රවල විහිදෙන ආර්ථික සංවර්ධනයට අදාළ උපදෙස් රැසක් බුදුසමය ඉදිරිපත් කරයි යන ප්‍රකාශය තහවුරු කරන්න. (ලකුණු 07)

9. (i) නිගණ්ඨයන්ගේ සතර සිද්ධිය අයිස්වාසියම් හතරක් නම් කරන්න. (ලකුණු 04)

(ii) එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් ලෝකයේ පවතින ප්‍රධාන ගැටලු [illegible] ලියන්න. (ලකුණු 07)

(iii) [illegible] (ලකුණු 07)

Scanned by CamScanner

2553 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2008 (2009)

S 5

(05) බෞද්ධ සමාජ දර්ශනය

(ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.)

{{ කොටස

2. (i) බ්‍රාහ්මණ, සඩ්ඩායක, අර්ථඩ්ඩායන, සවෙහාස යන පදවල විශේෂ අර්ථ අග්ගඤ්ඤ සූත්‍රයේ දැන්වේ. එම විශේෂාර්ථ සාකච්ඡාවේ දක්වන්න. (ලකුණු 04 යි)

(ii) අග්ගඤ්ඤ සූත්‍රයේ දැක්වෙන පරිදි රජ පදවියේ ප්‍රභවයට හේතු වූ පසුබිම පැහැදිලි කරන්න. (ලකුණු 07 යි)

(iii) තෘෂ්ණාව, අනුසන්ධිය හා අලසකම සත්ත්ව පරිණාමයට හේතු වූ ආකාරයත්, සදාචාර පරිහානිය පරිපර විපර්යාසයන්ට හේතු වූ ආකාරයත් අග්ගඤ්ඤ සූත්‍රයේ දැක්වේ. මේ කියමන සනාථ කරන්න. (ලකුණු 07 යි)

3. (i) පුදුසු කල දාවටහ විවාහ කරදීමෙන් හා දායාද පවරාදීමෙන් පසු මාධියෝ බිංබිසර් රජුගෙන් දෙයක් ඉටු වනු අපේක්ෂා කරති. ඒ ප්‍රතිකර්ම **සඳක** නම් කරන්න. (ලකුණු 04 යි)

(ii) සිඟාලෝවාද සූත්‍රයේ දැක්වුණු කවසිර දියුණු සමිඹන්ධය හෙටියෙන් දන්වා තෙවන්නෙන් ලබා දිය යුතු එම කරුණු උපයෝගී කරගන්නා ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 07 යි)

(iii) "දැනීමෙන් හා ගුණ යහපත්කමින් මුළුතැන්න ගිය, ශිෂ්‍යයන් කෙරෙහි දරු පෙම්බරකමින් යුතු ගුරු ප්‍රාර්ථනා හා ගුරුවරුන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් යුතුව මැනවින් ඉගෙන ගන්නා ශිෂ්‍ය ප්‍රාර්ථනා ඇති සමාජය ධර්ම ශාස්ත්‍රාලෝකයෙන් බැබළේ." යන කියමන සිඟාලෝවාද සූත්‍රයේ එන දකුණු දියා සමිඹන්ධය පදනම් කර ගනිමින් නිදර්ශනය කරන්න. (ලකුණු 07 යි)

4. (i) ධනය පරිහරණය කිරීමේ දී සිහිය යුතු ආකල්පයේ අංග **සතක** නම් කරන්න. (ලකුණු 04 යි)

(ii) ආර්ථික වර්ධනය උදෙසා බෞද්ධ ආර්ථික චින්තනය මඟින් පනවා තිබෙන සීමාවන් පහක් දැන්වා ඒ සීමා පැනවීම නිසා සිදු වන ඵලදායී පැහැදිලි කරන්න. (ලකුණු 07 යි)

(iii) "ධනයට දාසවන්නෝ නෘශංසවම දාස වේ." යන කියමන පදනම් කොට ගෙන බෞද්ධ ආර්ථික දර්ශනය විමතිවට ලක් කරන්න. (ලකුණු 07 යි)

5. (i) රජ පදවියේ ප්‍රභවය සිදු වූයේ කුමක් සඳහා ද? එම පදවියේ වගකීම කුමක් ද? රාජ්‍ය පදවි ලාභය වන්නේ කුමන පදනමක් මත ද? රජ පදවියට වරම් ලැබෙන්නේ කාගෙන් ද? යන කරුණු පිළිබඳ බ්‍රාහ්මණ මතය කෙටියෙන් දක්වන්න. (ලකුණු 04 යි)

(ii) එකී බ්‍රාහ්මණ මතයට ප්‍රතිපක්ෂ බෞද්ධ මතය දක්වා බෞද්ධ මතයේ වලංගුභාවය පරීක්ෂා කරන්න. (ලකුණු 07 යි)

(iii) අර්ථවත් රාජ්‍ය පාලනයක් සඳහා බුදු දහමින් ලද හැකි මාර්ගෝපදේශය පැහැදිලි කරන්න. (ලකුණු 07 යි)

6. (i) තපෝ බ්‍රහ්මචරියේන යන ගාථාව සම්පූර්ණ කරන්න. (ලකුණු 04 යි)

(ii) බ්‍රාහ්මණයන් විසින් සමාජය ස්තර හතරකට බෙදා දැක්වීම පදනම් වීරහිත ද්‍රව්‍යක් වැව් ප්‍රකට චිරිටට බුදුරදුන් ඉදිරිපත් කළ මුලික තර්ක හතරක් පැහැදිලි කරන්න. (ලකුණු 07 යි)

(iii) වර්ණභේදය ප්‍රතික්ෂේප කිරීමට බුදුරදුන් අනුගමනය කළ ප්‍රායෝගික ක්‍රියා මාර්ග විස්තර කරන්න. (ලකුණු 07 යි)

7. (i) සියලු ම මිනිසුන්ට ජීවත්වීම, දේපල පරිහරණය, සවුල් ජීවිත හත කිරීම, අදහස් පැවසීම ආදී කෙත්‍රවල පවත්නා අයිතිය ආරක්ෂා කරන ශ්‍රේෂ්ඨීයන් එය ප්‍රකාශයට පත් කළ සංවිධානයන් නම් කරන්න. (ලකුණු 04 යි)

(ii) පංච ශීලය පිළිබඳලින් දන්වා එමඟින් තහවුරු වන මිනිස් අයිතිවාසිකම් කවරේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 07 යි)

(iii) "ඉස්ලාම්වාදය මානව අයිතිවාසිකම් විනාශ කරයි." යන ප්‍රකාශය ශ්‍රී ලංකාවේ පසුගිය දශක තුන තුළ සැබෑ සිදුවීම් ඔස්සේ පරීක්ෂා කරන්න. (ලකුණු 07 යි)

8. (i) ධර්ම විස්සාසික යන ගෞරවාඛ්‍යාතය ලත් විවාහය ප්‍රවල නම් කරන්න. (ලකුණු 04 යි)

(ii) බෞද්ධ සාහිත්‍යයේ දැක්වෙන සතරාකාර විවාහක පවුල් නම් කරන්න. (ලකුණු 07 යි)

(iii) සාර්ථක විවාහ ජීවිතයක් ගොඩ නඟා ගැනීමට බුදු සමයෙන් ලැබෙන මාර්ගෝපදේශ විස්තර කරන්න. (ලකුණු 07 යි)

9. (i) නීතිය අවශ්‍ය වන්නේ කවර සමාජ පරිසරයක දී දැයි දක්වා නීතිය හා ගිලය අතර පවතින මූලික වෙනස කෙටියෙන් දක්වන්න. (ලකුණු 04 යි)

(ii) ගිහි ධම්මාජය සඳහා නීති පැනවීමට පාදක වූ කරුණු අතරින් ගිහි සමාජය ඉලක්ක කරගත් කරුණු සතර නම් කරන්න. (ලකුණු 07 යි)

(iii) "බුද්ධ නීතිය, සුවිශේෂ අරමුණු ඇතිව ශුක්මිය හා සාධාරණය ඉටු කරමින් බිහිසුණු අසුවම්වලින් ඇත් වී සාධාරණ විනිශ්චයක් ලබාදී වරදකරු ශුභාරූක්ඛාභාසය කරයි." යන ප්‍රකාශය සනාථ කරන්න. (ලකුණු 07 යි)

* * *

[සියලු හිමිකම් ඇවිරිණි]
[பதிப்புரிமையுடையது]
[All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

2551 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2007 (2008)

S 5

පැ තුනයි

(05) බෞද්ධ සමාජ දර්ශනය

I කොටසේ පියලු ප්‍රශ්නවලට ද, II වන කොටසින් තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
සැ.යු: I කොටසේ ප්‍රශ්නවලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම ලියා, II කොටසේ පිළිතුරු යමහ අමුණා ගාලාධිපතිට භාරදෙන්න.

විභාග අංකය :.....

I කොටස

(i) (අ) බුද්ධකාලීන භාරතයේ පැවති ප්‍රධාන දේශපාලන ක්‍රම **දෙක** නම් කරන්න.

.....

.....

(ආ) සිවිවණක් විරිය තුළ ම සමාන කුසලතා වර්ධනය විය යුතු බව බුදුරජාණන් වහන්සේ අපේක්ෂා කළ සේක. එම කුසලතා අතුරෙන් **දෙකක්** නම් කරන්න.

.....

.....

(ලකුණු 02 යි)

(ii) (අ) බුදු දහම මව්පියන් හැදින්වීමට භාවිත කළ ගෞරවනාම **දෙකක්** නම් කරන්න.

.....

.....

(ආ) බ්‍රහ්මයා වෙහ හිඛෙන උසස් ගුණ **හතරක්** මව් පියන් වෙත හිඛෙන බව බුදු දහම පවසයි. එම ගුණ **හතර** නම් කරන්න.

.....

.....

(ලකුණු 02 යි)

(iii) (අ) සත්ත්වයන්ට යහපත සැලසීමේ ගුණය පදනම් කොට ගෙන පැවසුණු බුදු ගුණ **දෙකක්** නව අරහාදි බුදුගුණවල ඇතුළත් වේ. එම බුදුගුණ **දෙක** නම් කරන්න.

.....

.....

(ආ) වෘක්‍ෂයකට වුව ද කළගුණ සැලකිය යුතු බව බුදුරජාණන් වහන්සේ ක්‍රියා ආදර්ශයක් මඟින් පෙන්වා දුන් සේක. ඒ සිද්ධිය කුමක් ද? සිදු වූයේ කිනම් අවස්ථාවක ද?

.....

.....

(ලකුණු 03 යි)

(iv) (අ) පරමාදර්ශී බෞද්ධ ගිහි පාලකයා සහ මනු හා සම වන පැවිදි නායකයා නම් කරන්න.

.....

.....

(ආ) පරමාදර්ශී බෞද්ධ ප්‍රජා පාලකයා තමාට අවනත වන රාජ්‍ය සමූහයේ ස්වාධිපත්‍යය ඵලෙස ම පවත්වාගෙන යෑමට ඉව සලසන බව, මනු එකී රජුන්ට දෙන එක් අවවාදයකින් පැහැදිලි වෙයි. එම **අවවාදය** නම් කරන්න.

.....

.....

(ලකුණු 03 යි)

[දෙවන පිටුව බලන්න.

Scanned by CamScanner

(v) (අ) නියාම ධර්ම අතුරෙන් සදාචාර හේතුඵල සන්තතියක් සේ සැලකිය හැකි නියාම ධර්මය නම් කරන්න.

.....

.....

(ආ) "යථාපි බමරො පුප්ඵං" යන ගාථාව සම්පූර්ණයෙන් ලියා මින් භික්ෂු ජීවිතයට දුන් උපදේශය කෙටියෙන් දක්වන්න.

.....

.....

(ලකුණු 03 යි)

(vi) (අ) මගධ රාජ්‍යයේ බලය ලබා ගැනීමට හා කෝසලයේ බලය ලබා ගැනීමට තම පියවරුන් ඝාතනය කරීම, බල අරගලය නිසා දේශපාලන සදාචාරය පිරිහී ගිය ආකාරය ප්‍රකට කරන නිදර්ශන වේ. එම පාලකයන් දෙදෙනා පිළිවෙළින් නම් කරන්න.

.....

.....

(ආ) තෘෂ්ණාවෙන් මෙහෙයවනු ලබන මෝඩ මිනිසුන් අතර නොමරමින් හා නොමරවමින් දැහැමින් රාජ්‍යයක් පාලනය කළ හැකි දැයි බුදුරදුන් මෙනෙහි කළ විට මාරයා දුන් පිළිතුර කුමක් ද?

.....

.....

(ලකුණු 03 යි)

(vii) (අ) "ධම්මේන මාතා පිතරෙ භරෙය්‍ය" යන ගාථාව සම්පූර්ණ කර ලියන්න.

.....

.....

(ආ) එම ගාථාවෙන් දෙන උපදෙස් ලියන්න.

.....

.....

(ලකුණු 03 යි)

(viii) (අ) ජනගහනය වැඩි වන විට රජයකට මුහුණපෑමට සිදු වන මූලික ප්‍රශ්න දෙකක් නම් කරන්න.

.....

.....

(ආ) බෞද්ධ ආර්ථික දර්ශනයට අනුව මිනිසාගේ මූලික අවශ්‍යතා හතරකි. එම අවශ්‍යතා හතර නම් කරන්න.

.....

.....

(ලකුණු 03 යි)

(ix) (අ) විද්‍යාවෙන් හා තාක්ෂණයෙන් මිනිසාට සැප සැලසෙතත් එය මූලික කරුණු දෙකකින් තොර වූ විට ඉන් විපත් සැලසේ. ඒ කරුණු දෙක නම් කරන්න.

.....

.....

(ආ) "සබ්බේ තසන්ති දණ්ඩස්ස" යන ගාථාව සම්පූර්ණ කර ලියන්න.

.....

.....

(ලකුණු 03 යි)

(x) (අ) අයෝග්‍ය භාර්යාවන් කිහිප දෙනකු බුදු දහමේ දැක්වෙයි. ඔවුන්ගෙන් දෙදෙනකු නම් කරන්න.

.....

.....

(ආ) විවාහක යුවළක් වෙත සම මට්ටමින් තිබිය යුතු යැයි සැලකෙන ගුණ ධර්ම හතර නම් කරන්න.

.....

.....

(ලකුණු 03 යි)

[ප්‍රශ්නය පිටුව බලන්න.

Scanned by CamScanner

1951 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2007 (2008)

(05) බෞද්ධ සමාජ දර්ශනය

S 5

(ප්‍රශ්න අතරතුර පමණක් හිඳිතුරු සපයන්න.)

II කොටස

(i) බුදුරජාණන් වහන්සේ විසින් ආනන්ද ස්ථවිරයන් වහන්සේ නම් කරන්න. (ලකුණු 04 යි)

(ii) වැලඳුම් වීරිය පැහැදෙන්නාක් මෙන් පොළඳවාගෙන දී වැළඳී සිටිය යුතු කුට ප්‍රකාරයන් දක්වන්න. (ලකුණු 07 යි)

(iii) "අපව්‍රිය සිවුරය පුදු සඳහා අපහරිතකාරී තත්ත්වයේ තබාගැනීම, ඔහුගේ දයාව පෙරදැරි කරගත් සියලු ශ්‍රාවකයන්ට ම අවස්ථානුරූප ආරක්ෂාවක් ලබාදීමට බුදු තුමා උපකල්ප දෙයි." යන ප්‍රකාශය සනාථ කරන්න. (ලකුණු 07 යි)

(i) නීති පැනවීමේ දී බුදුරජාණන් වහන්සේ අරමුණු කළ අංශයන් හඳුනාගෙන ඔහොට ගොන ඇත. ඉන් ගතරක් නම් කරන්න. (ලකුණු 04 යි)

(ii) එතුවක්ෂි රාහුලයන සිහිය වශයෙන් සැලකෙන පඤ්චඵලයෙන් සමාජ සුරක්ෂිතභාවය පැවැත්වෙන ආකාරය පැහැදිවිය දක්වන්න. (ලකුණු 07 යි)

(iii) "සියලු මිනිසුන ඒක සමාන බව නිදහස්වීමින් යුක්තිය හා සාධාරණත්වය ඉටු කිරීම අවශ්‍ය බව බුදු සමය පෝෂණය කරයි." යන මතයට ඔබ එකඟ වන්නේ ද? හේතු දක්වන්න. (ලකුණු 07 යි)

(i) බෞද්ධ දෘෂ්ටියේ දී සමාජය දියුණු වෙන්නේ කෙසේද යන්න පහදා තිබේ. එම දියුණු වීමට හේතු වන කරුණු සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(ii) සිගාලෝවාදසූත්‍රය දේශනා කිරීමේ පසුබිම මෙහි ඔබේ වචනයෙන් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 07 යි)

(iii) "සිගාලෝවාදසූත්‍රය ඇසුරින් ගිහි ජීවිතය සාර්ථක කරගැනීමට ඔබ ඉදිරිපත් කරන යෝජනා මොනවාද? ඒවා ඔබ තෝරාගැනීමට හේතු මොනවාද? විස්තර කරන්න. (ලකුණු 07 යි)

(i) ගිහි ජීවිතය සාර්ථක කරගැනීමට ධර්මය දෙක නම් කරන්න. (ලකුණු 04 යි)

(ii) මානව සදාචාරය නිර්මාණය වීමේ දී ජීව අජීව පරිසරය කෙතෙක් හා ආර්ථික වශයෙන් පරිහානියට පත්වන බව බුදු සමයේ දැක්වේ. මේ බව සාධකයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 07 යි)

(iii) වර්තමානයේ සංවර්ධනය උපකාර කර ගනිමින් අප අයට වඩා බ්‍රාහ්මණයන් උසස් බව දැක්වීමට දරන වෑයම් බාවිත්‍ය කළ බුදු දහම් කෙරේ තණ්හා ආකාරය පරීක්ෂාවට ලක් කරන්න. (ලකුණු 07 යි)

(i) රට පාලනයේ දී නීතිය හා ප්‍රඥාවර බිහිවීමට සක්විති රජ ප්‍රතිපත්ති හතරක් අනුගමනය කරයි. එම ප්‍රතිපත්ති හතර නම් කරන්න. (ලකුණු 04 යි)

(ii) දැනෑම් රජකුගේ ප්‍රියාචාරකම් හා පෞරුෂ ලක්ෂණ දනයකි. ඒවා නම් කරන්න. (ලකුණු 07 යි)

(iii) සාමය, සහජීවනය, සමානාත්මතාව හා ආර්ථික සමෘද්ධිය ස්ථාපනය කරන ප්‍රජාතාන්ත්‍රික පාලනයක් ගොඩ නැගීම සඳහා බුදු දහම උපදෙස් දෙයි. මේ කියමන සනාථ කරන්න. (ලකුණු 07 යි)

(i) අසංඛ්‍යාත පරිභෝජනයෙහි ඇබ්බැහිවුණු පස්දෙනකු බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වේ. ඒ පස්දෙනා නම් කරන්න. (ලකුණු 04 යි)

(ii) උප්පාතවත්ථු නිශ්පාදනයේ යෙදීමට අවශ්‍ය උපදෙස් අටක් අංගුත්තර නිකායේ දැක්වේ. එම කරුණු අවධාරණාත්මක කරන්න. (ලකුණු 07 යි)

(iii) "ධාර්මිකව ලෙස නිර්මාදනය කොට, අර්ථවත් ලෙස පරිභෝජනය කළ ගෘහපතිවරයෙක් මිදී හැසිරීමත් ජීවිතයක් ගතකිරීමට බුදු දහම උපදෙස් දෙයි." යන කියමන ඇගයීමට ලක් කරන්න. (ලකුණු 07 යි)

(i) "එසෙහ තොමහ ගැසීජයන්" යන ගාථාව සම්පූර්ණ කර ලියන්න. (ලකුණු 04 යි)

(ii) එහි දැක්වෙන උපදේශය පැහැදිවිය දක්වන්න. (ලකුණු 07 යි)

(iii) සිගාලෝවාදසූත්‍රයේ දැක්වෙන ධනය විනාශවීමට මං පාදන කරුණු නම් කර ඒවා ධනය විනාශ වීමට හේතු වන අකාරය පැහැදිවිය කරන්න. (ලකුණු 07 යි)

(i) මානව අයිතිවාසිකම් පිළිබඳ වියත් ප්‍රකාශයේ අරමුණු කෙටියෙන් දක්වන්න. (ලකුණු 04 යි)

(ii) අර්ථශාස්ත්‍රය පන්නිසේදයෙහි සත් හොරවරුනු ලැබීමේ මාර්ගවල අයිතිය සුරක්ෂිත කිරීමට සාදය දැක්වූ එකිනෙක් අයිතිය රැකෙන ආකාරය පැහැදිවිය දක්වන්න. (ලකුණු 07 යි)

(iii) "පරං රක්ඛන්තා අත්තානං රක්ඛති" යන උපදේශය පිළිපදිමින් "අනායන්ගේ මානව අයිතිවාසිකම් රකිනවා තම මානව අයිතිවාසිකම් රැක ගනියි." යන ප්‍රකාශය බුදු දහම් ආලෝකයෙන් විමසීමට ලක් කරන්න. (ලකුණු 07 යි)

* * *

Scanned by CamScanner

2550 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2006 (2007)

S 5

(05) බෞද්ධ සමාජ දර්ශනය

(ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.)

II කොටස

2. (i) පණ්ඩුකාභය රජුගේ දක්වෙන සිවුවණක් පිරිස නම් කරන්න. (ලකුණු 04 යි)
(ii) බුදුරදුන් තම ශ්‍රාවක පිරිස පරාර්ථ චර්යාවේ යොදවන ලද්දේ කවර අරමුණකින් ද? විමසන්න. (ලකුණු 07 යි)
(iii) "ගිහි පැවිදි දෙපක්ෂයට ම එක ම ශික්ෂා මාර්ගය අනුගමනය කළ නොහැකි බැවින් බුදුරජාණන් වහන්සේ ගිහි පිරිසට විශේෂ ශික්ෂණ මාර්ගයක් දැක්වූහ" යන කියමන විමසීමට ලක් කරන්න. (ලකුණු 07 යි)

3. (i) සාර්ථක ආර්ථික ජීවිතයක් සඳහා ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ දී ඉදිරිපත් කරන ලද සම්පදා හතර නම් කරන්න. (ලකුණු 04 යි)
(ii) ආරද්ධ වීර්යයෙන් යුක්ත තැනැත්තාගේ එක් දිනක ජීවිතය වුව ද ශ්‍රේෂ්ඨ බව පවසන ධම්මපද ගාථාව ලියන්න. (ලකුණු 07 යි)
(iii) සමතුලිත ආර්ථිකයක් ගොඩ නඟා ගැනීමට බුදු දහම ඉදිරිපත් කරන උපදේශ පරීක්ෂාවට ලක් කරන්න. (ලකුණු 07 යි)

4. (i) විවාහ ජීවිත ගත කරන අඹු සැමියන් කාෂ්ඨ හතරක් ඇති බව බෞද්ධ සාහිත්‍යයේ දැක්වෙයි. එම කාෂ්ඨ හතර නම් කරන්න. (ලකුණු 04 යි)
(ii) සප්ත භාර්යාවන් නම් කරන්න. (ලකුණු 07 යි)
(iii) "විවාහකයන්ගේ වගකීම් සහිත, යුතුකම්වත් බැඳුණු දිවි පෙවෙත ගෘහස්ථ සදාචාරය සඳහා හිතකර වේ." යන කියමන පරීක්ෂාවට ලක් කරන්න. (ලකුණු 07 යි)

5. (i) වෛරය සංසිඳෙන්නේ වෛර නො කිරීමෙන් බව දක්වෙන ධම්මපද ගාථාව ලියන්න. (ලකුණු 04 යි)
(ii) මෛත්‍රීභාවනාව වැඩීම සාමය සඳහා උපකාර වන අන්දම දක්වන්න. (ලකුණු 07 යි)
(iii) ත්‍රස්තවාදය තුරන් කර සාමය ස්ථාපනය කිරීම සඳහා භාවිතයට ගත හැකි බෞද්ධ උපදේශ කවරේ දැයි පරීක්ෂා කරන්න. (ලකුණු 07 යි)

6. (i) චතුර් වර්ණය නම් කරන්න. (ලකුණු 04 යි)
(ii) වර්ණ භේදය නිසා ඇතැම් භාරතීය ජන කොටස් අසාධාරණයට ලක් වූ ආකාරය විස්තර කරන්න. (ලකුණු 07 යි)
(iii) වර්ණ භේදය පදනම් කර ගත් අතාර්කික අවිද්‍යාත්මක භාරතීය සමාජ සංස්ථාව වෙනස් කිරීමට බුදුරදුන් දෙසූ ධර්මයන් අනුගමනය කළ ප්‍රායෝගික ක්‍රියා මාර්ගත් ඇගයීමට ලක් කරන්න. (ලකුණු 07 යි)

7. (i) බුදු දහම ඉදිරිපත් කරන පරමාදර්ශී පාලකයා නම් කරන්න. (ලකුණු 04 යි)
(ii) රජ පදවිය පැවරීම, රජ පදවියේ යුතුකම්, රජ පදවියේ සුදුසුකම්, රජ පදවියට පත් කිරීම යන කාරණා සම්බන්ධයෙන් බ්‍රාහ්මණ සංකල්පය හා බෞද්ධ සංකල්පය අතර ඇති වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 07 යි)
(iii) බෞද්ධ උපදේශ පදනම් කර ගනිමින් උසස් රාජ්‍ය පාලන සංවිධානයක් පිහිටුවා ගත හැකිය යන කියමන පරීක්ෂාවට ලක් කරන්න. (ලකුණු 07 යි)

8. (i) කරණීය මෙත්ත සූත්‍රයේ දී බෞද්ධයන් විසින් සුවපත් වේවා යි ප්‍රාර්ථනයට ලක් වන ජීව කොට්ඨාශ හතරක් නම් කරන්න. (ලකුණු 04 යි)
(ii) ජීව පරිසරය ආරක්ෂා කිරීම සඳහා පඤ්ච ශීල සමාදානයෙන් ලැබෙන පිටුවහල පරීක්ෂා කරන්න. (ලකුණු 07 යි)
(iii) පරිසරය රැක ගැනීම පිළිබඳ ව විශේෂ ආකල්පයක් ජනිත කිරීමට බුදු සමය ඇසුරෙන් ලබා ගත හැකි උපදෙස් පරීක්ෂාවට ලක් කරන්න. (ලකුණු 07 යි)

* * *

Scanned by CamScanner

Past Papers Wiki

II කොටස

2. (අ) සිගාලෝවාද සූත්‍රයෙහි දැක්වෙන යහළුවා හා ඉන් නියෝජනය වන පුද්ගලයන් නම් කරන්න. (ලකුණු 04 යි)

(ආ) සිගාලෝවාද සූත්‍රයෙහි දැක්වෙන යහපත් මිත්‍රයෙකුගේ ලක්ෂණවලින් යුතු පොරුළුය සංවර්ධනය කර ගත හැකි ආකාර හා සමාජීය අවශ්‍යතා හැකි සැටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 07 යි)

(ඉ) සදියා ඇදහිලිකාරයා සමාජ සංස්ථාවේ යහපතට පැවැත්මට දායකවන අන්දම පැහැදිලි කරන්න. (ලකුණු 07 යි)

3. (අ) සුභාෂිතය නම් කරන්න. මෙත්තා / කාරුණ්‍ය / මුදිතා / උපේක්ඛා (ලකුණු 04 යි)

(ආ) දැඩිසේ ආත්මාර්ථය සඳහා අර්බුදයන් කාර්ය ගාරයක් ඇති කළ හැක්කේ ඒය අයිව පරිසරයේ පවතිවල සිදුවන්නා බව වළඳා ගත් සහර බුදු විගරශයෙන් දැන් හැකිලෙනතුරු පමණි යන කියමන පරීක්ෂාවට ලක් කරන්න (ලකුණු 07 යි)

(ඉ) බුදු දැයෙන් පිළිබිඹු වන බුදු රදුන්ගේ පරිහාර නිහඬතාමිත්වය විස්තර කරන්න. (ලකුණු 07 යි)

4. (අ) ධම්මිය සූත්‍රයෙහි සඟ පිරිසෙනුගේ කිසිය හැකුණා දැක්වෙන ආකාරය ලියන්න. (ලකුණු 04 යි)

(ආ) යහපත් ලුහුබඳින් බොදුන් උපදේශ පරිසරයක සංස්කෘතික ලෝකයෙහි ක්‍රියාත්මක කිරීමට අපහසුය. යන ප්‍රකාශය පිළිබඳ ව සාකච්ඡාවකයක් කරන්න. (ලකුණු 07 යි)

(ඉ) සිමින සමිපයක් ඇසුරෙන් අසිමින ආකාරයන් සපුරා ගැනීම ආර්ථික විද්‍යාවේ කාර්යය බව විග්‍රහකරන ආර්ථික විද්‍යාඥයෙක් සිටියි. බෞද්ධ ආර්ථික දර්ශනය පාදක කොට ගනිමින් මේ කියමන පරීක්ෂාවට ලක් කරන්න (ලකුණු 07 යි)

5. (අ) රටවැසි කාර්යන් බවට හා ස්වාධීනත්වයට පෑම් කරන යක්ඛිනි වශ් තනතරන් නම් කරන්න. (ලකුණු 04 යි)

(ආ) යක්ඛිනි රංජනගේ ආගමෙන්ගේ ප්‍රතිපත්ති වර්තමාන අන්තර් රාජ්‍ය අර්බුද විසඳීම් සඳහා යොදු ගත හැකි ආකාරය පරීක්ෂාවට ලක් කරන්න. (ලකුණු 07 යි)

(ඉ) පරමාදර්ශී රාජ්‍යයක් පිළිබඳ බෞද්ධ සංකල්පය විස්තර කරන්න. (ලකුණු 07 යි)

6. (අ) බුදු සමයෙහි දක්වෙන භාර්යාවන් සත් දෙනා නම් කරන්න. (ලකුණු 04 යි)

(ආ) භාර්යාවකගේ ලක්ෂණ නම් කර එවායේ අගය පරීක්ෂා කරන්න. (ලකුණු 07 යි)

(ඉ) සාර්ථක විවාහ ජීවිතයක් සඳහා බුදු සමය ඉදිරිපත් කරන උපදෙස් මඟින් වර්තමාන අභිසැමි ආරවුල් සමනය කර ගත හැකි ආකාරය පරීක්ෂාවට ලක් කරන්න. (ලකුණු 07 යි)

7. (අ) නාරතීය වතුර් වර්ණය නම් කරන්න. (ලකුණු 04 යි)

(ආ) වර්ණ භේදය අවධි ගුණය සම්මතයක් බව පැහැදිලි කිරීමට බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කර ඇති කරුණු හා අනුගමනය කළ ක්‍රියා මාර්ග ඇතුළත් කිරීමක් ලක් කරන්න. (ලකුණු 07 යි)

(ඉ) තපෙන බ්‍රහ්මචරියෙන
සංයමෙන දමෙන ච
එතෙන බ්‍රාහ්මණෝ හොති
එතං බ්‍රාහ්මණමුත්තමං
යන්න පාදක කොට ගෙන ශ්‍රේෂ්ඨත්වයට මිනිසා පත් කරන කරුණු කවරේ දැයි පරීක්ෂා කරන්න. (ලකුණු 07 යි)

8. (අ) මානව අයිතිවාසිකම් පිළිබඳ ව විශ්ව ප්‍රකාශනය පිළිබඳ ව කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 04 යි)

(ආ) බුදු සමයෙහි මානව අයිතිවාසිකම් ස්ථාපිත කිරීම සඳහා ජේවිතාවෙන් එසහනාව ප්‍රතාග කරන ප්‍රතාග පහ නම් කරන්න. (ලකුණු 07 යි)

(ඉ) ගාරතීය සමාජයේ විවිධ ස්ථාන මත අහිමි වී ඇති මානව අයිතිවාසිකම් ඒ ඒ ජනකොටස්වලට ලබා දීම සඳහා බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කළ යම් කරුණු හා ක්‍රියා මාර්ග ඇගයීමට ලක් කරන්න. (ලකුණු 07 යි)

* * *

Scanned by CamScanner

PARCEL NO

LOL.lk
BookStore

විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න



කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සුභාර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න

www.Pastpapers.Wiki

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library